ධීවර ත්‍යාග අරමුදල - 2015

---------------------------------

ධීවර ත්‍යාග අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ දහවන කොටසේ 59(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** මූල්‍ය ප්‍රකාශන

----------------

**2.1** මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ධීවර ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

**2.2.1** ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

අරමුදලේ අසම්භාව්‍ය වත්කම් වශයෙන් හඳුනාගත හැකි, අත්අඩංගුවට ගෙන නීත්‍යානුකූල කටයුතු අවසන් වන තෙක් දිස්ත්‍රික් ධීවර කාර්යාල, අධිකරණ හා නාවික හමුදාව භාරයේ ඇති යාත්‍රා හා උපකරණ පිළිබඳ තොරතුරු ලබාගෙන මූල්‍ය වාර්තාවල සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** නිති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF 423 හි 04:3 වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**3 .** මූල්‍ය සමාලෝචනය

---------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.1¸865,239 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,452,616 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.412,623 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**4 .** මෙහෙයුම් සමාලෝචනය

-------------------------

**4.1** කාර්ය සාධනය

----------------

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා එහි සංශෝධන මගින් බලාත්මක වන නියෝග උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන බලයලත් නිලධාරීන්ට සහ තොරතුරු සපයන්නන්ට ත්‍යාග මුදල් ලබාදීම මගින් ඔවුන් දිරිමත් කිරීම සඳහා එම පනතේ 59 වන වගන්තිය යටතේ ධීවර ත්‍යාග අරමුදල ස්ථාපිත කර තිබුණ ද, තොරතුරු සපයන්නන් හට ත්‍යාග මුදල් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායමෙන් සියයට 75 ක් මේ සඳහා භාවිතා කිරීමට ප්‍රතිපාදන තිබූ නමුත් ඉකුත් වර්ෂයේ ඉපයූ ආදායම වූ රු.1,452,616 කින් කිසිදු මුදලක් මේ සඳහා වැය කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ඉපයූ රු.2,222,614 කින් නිලධාරීන්ට දීමනා ගෙවීමට වැය කර තිබුණේ රු.357,375 ක් පමණි. මේ අනුව ජලජ සම්පත් ආරක්ෂා කිරීමේ නියෝග උල්ලංඝණය කරන තැනැත්තන් පිළිබඳව කටයුතු කරන බලයලත් නිලධාරීන් සහ ඒ පිළිබඳ තොරතුරු සපයන තැනැත්තන් දිරිමත් කිරීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

**4.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

අත්අඩංගුවට ගත්, මසුන් අලෙවි කිරීමෙන් 2013 වර්ෂයට හා 2014 වර්ෂයට අදාලව ලැබිය යුතු පිළිවෙලින් රු.358,230 ක් හා රු.193,596 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **ක්‍රියාකාරි සැලැස්ම**

**ධීවර හා ජලජ සම්පත් පනත හා බලාත්මකවන නියෝග උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් විවිධ චෝදනා යටතේ ඉකුත් වර්ෂයේ දිස්ත්‍රික්ක 11 ක නඩු 268 ක් පවරා තිබූ අතර , සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික්ක 14 ක නඩු 348 ක් පවරා තිබුණි. එසේ වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරි සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ පැවරීමට අපේක්ෂා කර තිබූ නඩු සංඛ්‍යාව 200ක් වශයෙන් ලඟා විය හැකි මට්ටමට වඩා බෙහෙවින් අඩු මට්ටමකින් දක්වා තිබුණි.**

**5.2** **අභ්‍යන්තර විගණනය**

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලැස්මේ ධීවර ත්‍යාග අරමුදල සම්බන්ධව වැඩ සටහන් ඇතුළත් කර අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.**

**6.** **පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.**

**(අ) පොත්පත් පවත්වා ගැනීම - අත්අඩංගුවට ගෙන නීත්‍යානුකූල කටයුතු අවසන් වන තෙක් ශ්‍රී ලංකා නාවික හමුදාව, දිස්ත්‍රික් ධීවර කාර්යාලය සහ උසාවි භාරයේ ඇති යාත්‍රා සහ උපකරණ සම්බන්ධ තොරතුරු පවත්වා ගැනීම.**

**(ආ) නිලධාරීන්ට තෑගි මුදල් ගෙවීම - අරමුදලට ලැබෙන ආදායමෙන් අදාල නිලධාරීන්ට අප්‍රමාදව ත්‍යාග මුදල් ගෙවීමට කටයුතු කිරීම.**